සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ. පො. ස. (උ. පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2020

13 ශ්‍රේණිය | කෘෂි විද්‍යාව I | 08 S I | පැය දෙකයි / இரண்டு மணித்தியாலம் / *Two hours*

**උපදෙස් :**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 01 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

01. කෘෂි කර්මාන්තයට අදාළ සමූපකාර සමාගම් (Co-operative Companies) පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - අතරමැදියාගේ බලපෑම වැඩි ය.

B - ලාභය සෘජුවම නිෂ්පාදකයාට ලැබේ.

C - කිහිපදෙනෙක් එක්වීමෙන් ක්‍රියාත්මක වේ.

මෙයින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වනුයේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. A හා B පමණි. 5. B හා C පමණි.

02. හරිත විප්ලවය නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කමක් නොවන්නේ,

1. බහු බෝග වගාවන් යොදා ගැනීම.
2. රසායනික ද්‍රව්‍ය අධි භාවිතය.
3. අධික යාන්ත්‍රිකරණය.
4. උසස් ප්‍රභේද වගා කිරීම.
5. කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රම භාවිතය.

03. වායුගෝලයේ පවතින ජලවාෂ්ප පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. සාමාන්‍යයෙන් පාංශු වාතයට වඩා වැඩි ජල වාෂ්ප ප්‍රමාණයක් වායුගෝලීය වාතයේ පවතී.
2. වැඩි උෂ්ණත්වය යටතේ අඩු ජල වාෂ්ප ප්‍රමාණයක් වාතයේ පවතී.
3. අඩු උෂ්ණත්වය යටතේ අඩු ජල වාෂ්ප ප්‍රමාණයක් වායු ගෝලයේ රඳවා ගනී.
4. වායුගෝලීය ජල වාෂ්ප ප්‍රමාණය හා උෂ්ණත්වය අතර සම්බන්ධයක් නොමැත.
5. වායුගෝලීය ජලවාෂ්ප ප්‍රමාණය පරාගනය අතර සම්බන්ධයක් නැත.

04. කාලගුණික මධ්‍යස්ථානයක උපකරණ හා ඒවා සංස්ථාපනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - වර්ෂාමානය සෙ. මී. 30 ක්වත් උස විය යුතුය.

B - සූර්ය දීප්තමානය පොළවේ සිට 1.5 m උසින් උතුරු දකුණු දිශාව ඔස්සේ ස්ථාන ගත කළ යුතුය.


C - වාෂ්පීකරණ තැටිය 18 cm උසට ජලය පුරවා තැබිය යුතුය.

D - සූර්ය දීප්තමානයට සටහන් පත් යෙදීම දවසට වරක් සිදු කළ යුතුය.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

1. A හා B පමණි. 2. B හා C පමණි. 3. C හා D පමණි. 4. A හා C පමණි. 5. B හා D පමණි.

* පසක හරස්කඩක් ආශ්‍රිතව සිදුවන සංසිද්ධි කිහිපයක් පහත රූප සටහනේ දක්වා ඇත.




05. පාංශු සංරක්ෂණ ක්‍රියාවලියේ දී බලපෑම් ඇති කරනුයේ,

1. A හා X ය. 2. B හා C ය. 3. A හා C ය. 4. A හා B ය. 5. B හා Q ය.

06. ඝනත්වය වැඩිම පස් සහිත කොටසක් වනුයේ,

1. X කලාපයයි. 2. Y කලාපයයි. 3. Z කලාපයයි. 4. P කලාපයයි. 5. Q කලාපයයි.

07. යම් කිසි පස් නියදියක මුළු කැටායන ප්‍රමාණය 20 meq/100g ද ආම්ලික කැටායන 5 meq / 100g ද නම් එම පසේ භෂ්ම සංතෘප්තිය වනුයේ,

1. 25% ය. 2. 75% ය. 3. 15% ය. 4. 5% ය. 5. 20% ය.

08. පස් නියැදියක ඝනත්වය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වනුයේ,

1. පස බුරුල් කිරීමේ දී සත්‍ය ඝනත්වය අඩු වේ.
2. පස බුරුල් කිරීමේ දී දෘෂ්‍ය ඝනත්වය වැඩි වේ.
3. පස බුරුල් කිරීමේ දී සත්‍ය ඝනත්වය වැඩි වේ.
4. පසක සච්ඡිද්‍රතාවය අඩුවන විට දෘෂ්‍ය ඝනත්වය අඩුවේ.
5. පසේ සච්ඡිද්‍රතාවය පවතින විට දෘෂ්‍ය ඝනත්වය අඩු වේ.

09. පහත දක්වා ඇත්තේ පෝෂක වර්ගීකරණය කර ඇති කාණ්ඩ තුනකි.

A - P K Cl B - Ca fe B C - CO I Na

ඉහත වර්ගීකරණයට පදනම්ව ඇත්තේ,

1. A යනු අත්‍යාවශ්‍ය මූලද්‍රව්‍ය වන අතර B යනු අත්‍යාවශ්‍ය නොවන පෝෂක ය.
2. B යනු අචල පෝෂක වන අතර, C යනු උපකාරක මූලද්‍රව්‍යයන් ය.
3. B යනු අත්‍යවශ්‍ය පෝෂක හා වන අතර, C යනු සචල පෝෂක ය.
4. A යනු අචල මූලද්‍රව්‍යයක් වන අතර, B යනු සචල මූලද්‍රව්‍යයන්ය.
5. A යනු උපකාරක මූලද්‍රව්‍යයක් වන අතර, B යනු අත්‍යාවශය මූලද්‍රව්‍යයන් ය.

10. බෝග ක්ෂේත්‍රයක පොස්පරස් පෝෂකය ඉහළ නැංවීමට උදව් විය හැකි රසායනික හා ජෛව යුගලය වන්නේ,

1. SSP හා *Azotobacter* ය.
2. MOP හා *Penicillium* ය.
3. TSP හා *Rhizobium* ය.
4. සාන්ද්‍ර සුපර් පොස්පේට් හා *Aspergillus* ය.
5. පොටෑසියම් නයිට්‍රේට් හා Bacillus නම් විශේෂ ය.

11. යූරියා සහ තවත් පොහොර වර්ග දෙකක් භාවිත කර 100 kg ක පොහොර මිශ්‍රණයක් 15 : 10 : 10 ශ්‍රේණිය යටතේ සැකසීමට අවශ්‍ය (Urea) ප්‍රමාණය වනුයේ,

1. කි. ග්‍රෑ. 441 කි. 2. කි. ග්‍රෑ. 44 කි. 3. කි. ග්‍රෑ. 100 කි.
4. කි. ග්‍රෑ. 222 කි. 5. කි. ග්‍රෑ. 22 කි.

12. පහත සඳහන් වනුයේ බිම් සැකසීමට යොදා ගන්නා උපකරණ කිහිපයකට අදාළ වගන්ති කිහිපයකි.

A - මට්ටම් පෝරුව ද්විරෝද ට්‍රැක්ටරයට සම්බන්ධකර ක්‍රියා කරයි.

B - උපකරණ සමහර අවස්ථාවල යාන්ත්‍රික බලයෙන් ක්‍රියා කරයි.

C - කොකු නගුල ප්‍රාථමික මෙන්ම ද්විතික බිම් සැකසීමට ද යොදා ගනී.

D - ගැමි ලී නගුල සත්ත්ව බලයෙන් ක්‍රියා කරයි.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වනුයේ,

1. A හා B පමණි. 2. B හා C පමණි. 3. C හා D පමණි. 4. A හා D පමණි.

13. බෝග ප්‍රචාරණයේ දී බහුලව භාවිත කරන තවාන් වර්ග කිහිපයක් පහත දැක්වේ.

A - ගිල්වූ තවාන් B - උස් තවාන් C - වැලි තවාන්

D - බඳුන් තවාන් E - නොරිඩෝකෝ තවාන්

මෙයින් අඹ ග්‍රාහක පැළ සකස් කිරීමට යෝග්‍ය තවාන් වර්ගය / වර්ග වනුයේ,

1. A හා B පමණි. 2. B පමණි. 3. C පමණි. 4. C හා D පමණි. 5. D පමණි.

14. වගා ක්ෂේත්‍රයක් සඳහා ජල ප්‍රභවයක් තේරීමේ දී අවම සැලකිල්ලක් දැක්විය යුතු කරුණ වනුයේ,

1. ජලයේ ජෛවීය ගුණාංග යි. 2. ජලයේ ගුණාත්මය යි. 3. ජල සම්පාදන ක්‍රමය යි.


4. ජල ප්‍රභවයට ඇති දුර යි. 5. භූ විෂමතාවය යි.

15. බෝග ක්ෂේත්‍රයකට පමණට වඩා ජල සම්පාදනය කිරීමෙන් ඇතිවිය හැකි ගැටළුවක් **නොවන්නේ,**

1. ශිලා බැසීම ය. 2. සත්‍ය ඝනත්වය වැඩිවීම ය. 3. ජල වහනය දුර්වල වීම ය.

4. පාංශු ඛාදනය සිදුවීම ය. 5. කාන්දුවීම් අඩු වීම ය.

* **ප්‍රශ්න අංක 16 සඳහා පිළිතුර දීමට පහත ප්‍රස්තාරය භාවිතා කරන්න.**




16. මෙම ප්‍රස්තාරයෙන් පෙන්වනු ලබන කායික විද්‍යාත්මක ක්‍රියාවලින් වනුයේ, **පිළිවෙලින් X හා Y යනු,**

1. ඔක්සිජන් සාන්ද්‍රණය හා ශ්වසන වේගයයි.

2. $CO_2$ සාන්ද්‍රණය හා ප්‍රභාසංස්ලේෂණ වේගයයි.

3. ශ්වසන වේගය හා උෂ්ණත්වයයි.

4. ශ්වසන වේගය හා ඔක්සිජන් සාන්ද්‍රණයයි.

5. උෂ්ණත්වය හා ප්‍රභාසංස්ලේෂණ වේගයයි.

17. පුෂ්පයක් ස්ව පරාගනය සඳහා දක්වන අනුවර්තනයක් වනුයේ,

1. ඒක ලිංගික පුෂ්ප ඇතිවීම ය. 2. ස්ව වන්ධ්‍යතාව ඇතිවීම ය. 3. ද්වි ලිංගික පුෂ්ප ඇති වීම ය.

4. ස්ව අසංගතිය ඇති වීම ය. 5. අසම පරිණතිය ඇති වීම ය.


18. මුලෙහි අරීය පරිවහනය සිදු කරන අනුයාත පිළිවෙල පහත ගැලීම් සටහනේ දක්වා ඇත.

මූලකේෂ ⟶ (A) ⟶ (B) ⟶ (C) ⟶ (D) ⟶ ශෛලම / ප්ලෝයම

එම ක්‍රියාවලිය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. A යනු පරිචක්‍රය වන අතර, C යනු බාහිකයයි.
2. A යනු අපිචර්මය වන අතර, B යනු අන්තඃශ්චර්මයයි.
3. B යනු බාහිකය වන අතර, C යනු ප්ලෝයම පටකයයි.
4. C යනු අන්තඃශ්චර්මය වන අතර, D යනු අපිචර්මයයි.
5. A යනු අපිචර්මය වන අතර, C යනු අන්තඃශ්චර්මයයි.

19. පහත දක්වා ඇත්තේ ශාක වර්ධක ප්‍රචාරණයට යොදා ගන්නා ව්‍යුහයන් දෙකකි.


A


B

එම ව්‍යුහ පිළිබඳ සත්‍ය ප්‍රකාශය වනුයේ,

1. A ව්‍යුහය ශාකයේ කඳ පාදස්ථයේ පාර්ශ්වික අංකුරවලින් හටගන්නා අතර, B ව්‍යුහයේ පත්‍රවල ආහාර තැන්පත් වී හට ගනී.
2. B ව්‍යුහය පත්‍ර පාදයේ ආහාර තැන්පත් කර හටගන්නා අතර, A ව්‍යුහය පාර්ශ්වික මුල්වල ආහාර තැන්පත් වී හට ගනී.
3. B යනු ශාක කඳ වන අතර, A යනු පාර්ශවික මුල් වේ.
4. A ව්‍යුහ බෝග ප්‍රචාරණයට බහුලව යොදා ගන්නා අතර, B ව්‍යුහය වාණිජ වගාවල භාවිතා නොකරයි.
5. A ව්‍යුහය වාණිජව ප්‍රචාරණය සඳහා යොදා නොගන්නා අතර, B ව්‍යුහය බහුලව යොදා ගනී.

20. බීජ ප්‍රරෝහණ ආකාර සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ඒක බීජ පත්‍රී බීජ සියල්ල අධෝ භෞම ප්‍රරෝහණයක් පෙන්වන අතර, ද්විබීජ පත්‍රී බීජ සියල්ල අපි භෞම ප්‍රරෝහණයක් පෙන්වයි.

B - අපි භෞම ප්‍රරෝහණයේ බීජාධරය වේගයෙන් වර්ධනය වන අතර, අධෝ භෞම ප්‍රරෝහණයේ දී බීජෝපරිය වේගයෙන් වර්ධනය වේ.

C - අපි භෞම ප්‍රරෝහණයේ දී බීජෝපරිය වේගයෙන් වර්ධනය වන අතර, අධෝ භෞම ප්‍රරෝහණයේ දී බීජාධරය වේගයෙන් වර්ධනය වේ.

D - ඒක බීජ පත්‍රී ශාක සියල්ල අධෝ භෞම වන අතර, ද්විබීජ පත්‍රී බීජ බොහොමයක් අපි භෞම වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය ප්‍රකාශ වනුයේ,

1. A හා B පමණි. 2. B හා C පමණි. 3. C හා D පමණි. 4. B හා D පමණි. 5. A හා D පමණි.

21. අතු බැඳීමට යොදා ගන්නා දඬු කැබලි පිළිබඳ සතය ප්‍රකාශය වනුයේ,

1. මල් පිපී අවසන් වූ දඬු කැබලි වඩාත් යෝග්‍ය වේ.
2. ලා දඬු කැබලි වඩාත් යෝග්‍ය වේ.
3. අංකුර ප්‍රමාණය අඩු දඬු කැබලි වඩාත් යෝග්‍ය වේ.
4. ඕනෑම ප්‍රමාණයක මේරීමක් සහිත දඬු කැබලි යෝග්‍ය වේ.
5. අඩ දළ දණ්ඩ වඩාත් යෝග්‍ය වේ.

22. පොල් ශාකයේ ඇතිවන සුප්තතාවය පිළිබඳ වඩාත් නිවැරදි වගන්තිය වනුයේ,

1. බීජාවරණයේ ඝනකම නිසා ඇතිවන තත්ත්වයකි.
2. වර්ධක නිශේධක නිසා ඇතිවන තත්ත්වයකි.
3. රූපානු හා කායික විද්‍යාත්මකව ඇතිවන තත්ත්වයකි.
4. අපාරගම්‍ය බීජාවරණය නිසා ඇතිවන තත්ත්වයකි.
5. හෝමෝන වල බලපෑම නිසා ඇතිවන තත්ත්වයකි.

23. විකෘති ඇතිවීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - මෙම විකෘති සෑම විටම හානිකර වේ.

B - දෛනික ක්ලෝන විචලතාවය මගින් ඇති විය හැක.

C - බහු ගුණක මගින් ද ඇති විය හැක.

D - විකෘතියක් යනු වර්ණදේහවල ඇතිවන තාවකාලික තත්ත්වයයි.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. C හා D පමණි. 5. B හා C පමණි.

24. ආරක්ෂිත ගෘහ තුළ උෂ්ණත්වය පාලනය කිරීමෙන්,

1. අස්වනුවල ආර්ථික වටිනාකම වැඩි වේ.
2. ශාකවල කායික විද්‍යාත්මක ක්‍රියා ප්‍රශස්ථ වේ.
3. ශාකවල ජල අවශෝෂණය අවම වේ.
4. ශාකවල පෝෂක අවශෝෂණය වේගවත් වේ.
5. නිවර්තන කලාපීය බෝග මනා ලෙස වගා කළ හැකි වේ.

25. නිර්පාංශු වගාව යොදාගත හැකි කෘත්‍රිම කාබනික මාධ්‍ය කාණ්ඩය වනුයේ,

1. දහයියා, ලී කුඩු හා පොලිඊතර් ය.
2. වර්මිකියුලයිට්, පොලිෆීනෝල් හා පොලියුරෙතින් ය.
3. පොලිෆීනෝල්, පොලිඊතර් හා පොලිවයිනයිල් ය.
4. පර්ලයිට්, වර්මිකියුලයිට් හා පොලිෆීනෝල් ය.
5. කොහුබත්, කොහු කෙඳි හා ලී කුඩු ය.


26. පහත දක්වා ඇති තත්ත්ව අතුරින් පළිබෝධ තත්ත්වයක් ඇතිවීමට ආසන්නම හේතුවක් විය නොහැක්කේ,

1. පාරම්පරික බෝග වලින් ඈත් වීම ය.
2. ඒක බෝග වගාව සිදු කිරීම ය.
3. වෙනත් රටවලින් හඳුන්වා දුන් බෝග පමණක් වගා කිරීම ය.
4. ජෛව විවිධත්වය ක්ෂේත්‍රයේ අඩු වීම ය.
5. ගොවිපල අවට පරිසරයේ ජීවීන්ගේ සමතුලිතතාව බිඳ වැටීම ය.

27. පහත කෘමි ගෝත්‍ර අතුරින් අර්ධ රූපාන්තරණයක් දැකිය හැක්කේ,

1. හයිමෙනොප්ටෙරා, තයිසනොප්ටෙරා, හෙමිප්ටෙරා සහ ඕතොප්ටෙරා ය.
2. තයිසනොප්ටෙරා, හෙමිප්ටෙරා, ඕතොප්ටෙරා හා හෝමොප්ටෙරා ය.
3. හයිමෙනොප්ටෙරා, ඩිප්ටෙරා, තයිසනොප්ටෙරා හා හෝමොප්ටෙරා ය.
4. ඕතොප්ටෙරා, ඩිප්ටෙරා, හෙමිප්ටෙරා හා කෝලියොප්ටෙරා ය.
5. හයිමෙනොප්ටෙරා, තයිසනොප්ටෙරා, ඩිප්ටෙරා හා හෙමිප්ටෙරාවන් ය.

28. රෝග ත්‍රිකෝණය හා සම්බන්ධ රූප සටහන් කිහිපයක් පහත දක්වේ.




මෙම රූප සටහන් පිළිබඳව නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. A යනු තීව්‍ර රෝගීවන අතර C යනු මදක් රෝගී තත්ත්වයකි.
2. B යනු මදක් රෝගී වන අතර D යනු තීව්‍ර රෝගී තත්ත්වයකි.
3. C යනු රෝගයට ආසන්න තත්ත්වයක් වන අතර, D යනු මදක් රෝගී තත්ත්වයකි.
4. D යනු මදක් රෝගී වන අතර, B යනු උග්‍ර රෝගී තත්ත්වයකි.
5. A යනු නිරෝගී තත්ත්වයක් වන අතර, B යනු මදක් රෝගී තත්ත්වයකි.

29. පළිබෝධ වසංගත තත්ත්වයන් පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දක්වේ.

A - අධික පොහොර භාවිතය නිසා පළිබෝධ ප්‍රචණ්ඩ මාදිලි බිහි වේ.

B - ප්‍රචණ්ඩ පළිබෝධ මාදිලි නිසා වසංගත තත්ත්ව ඇති වේ.

මෙම ප්‍රකාශ පිළිබඳ සත්‍ය ප්‍රකාශය වනුයේ,

1. A හා B ප්‍රකාශ නිවැරදි අතර B මගින් A පැහැදිලි කරයි.
2. A හා B ප්‍රකාශ දෙකම නිවැරදි අතර,A මගින් B පැහැදිලි කරයි.
3. A හා B නිවැරදි අතර, B මගින් A පැහැදිලි නොකරයි.
4. A නිවැරදි අරත B වැරදි වේ.
5. A වැරදි අතර, B නිවැරදි වේ.

30. පළිබෝධනාශකයක ධූලකතාවය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. ඉතා උග්‍ර විෂ සහිත සංයෝග රතු වර්ණ දාරයෙන් ද උග්‍ර විෂ සහිත සංයෝග කහ වර්ණ දාරයෙන් ද පෙන්වයි.
2. ඉතා උග්‍ර විෂ රතු පාට දාරයෙන් හා අඩු විෂ සහිත සංයෝග කොළ පාට දාරයෙන් පෙන්වයි.
3. ඉතා උග්‍ර හා උග්‍ර විෂ සංයෝග දෙකම රතු පැහැ දාරයෙන් ද මධ්‍යම විෂ සහිත සංයෝග කොළ පාට දාරයෙන් ද පෙන්වයි.
4. ඉතා උග්‍ර හා උග්‍ර විෂ සංයෝග දෙකම රතු පැහැයෙන් හා අඩු විෂ සහිත සංයෝග නිල් පැහැ දාරයෙන් පෙන්වයි.
5. අඩු විෂ හිත සංයෝග කොළ පැහැයෙන් හා ඉතා අඩු විෂ සංයෝග සුදු පැහැ දාරයෙන් පෙන්වයි.

31. නිරෝගී ශ්‍රී ලාංකිකයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකයට අනුව (BMI) පැවතිය යුතු අගය පරාසය වනුයේ,

1. 15 - 25 ය. 2. 20 - 24 ය. 3. 22 - 27 ය. 4. 25 - 27 ය. 5. 24 - 26 ය.

32. ආහාර සැකසීමේ නව ප්‍රවණතාවයන් පිළිබඳ සත්‍ය ප්‍රකාශ වනුයේ,

1. ආහාර ප්‍රබල කිරීමේ දී බාහිරින් පෝෂක එකතු කිරීම අනිවාර්ය ක්‍රියාවක් වේ.
2. අගය එකතු කිරීමේ දී ආහාරයේ පෝෂණ අගය අනිවාර්යයෙන්ම වැඩි වේ.
3. අවම සැකසීමට ලක් වූ ආහාර වර්තමානයේ එතරම් ප්‍රචලිත නොවේ.
4. ආහාර විවිධාංගීකරණය සඳහා ඉහළ තාක්ෂණයක් අත්‍යාවශ්‍ය වේ.
5. ආහාර සරු කිරීම කළ හැක්කේ ආහාර කිහිපයක් සඳහා පමණක් වේ.

33. ආහාරවලට අදාළ ප්‍රමිති සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ආහාර ප්‍රමිතිකරණයෙන් සෑම විටම සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයාට ලැබේ.

B - මෙමගින් පාරිභෝගික විශ්වාසය තහවුරු වේ.

C - ආහාර නරක්වීම අවම කරයි.

ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වනුයේ,

1. A, B හා C පමණි. 2. A හා B පමණි. 3. B හා C පමණි. 4. B පමණි. 5. C පමණි.

34. පසු අස්වනු හානි කෙරෙහි බලපාන කායික විද්‍යාත්මක සාධක කාණ්ඩය වනුයේ,

1. ශ්වසනය, ක්ෂුද්‍ර ජීවීන්, තුවාල වීම සහ උත්ස්වේදනය යි.
2. උත්ස්වේදනය, ශ්වසනය, තුවාල වීම් හා සාපේක්ෂ ආර්ද්‍රතාවය යි.
3. එතිලීන් නිෂ්පාදනය, වායුගෝලීය සංයුතිය, ශ්වසනය හා උත්ස්වේදනය යි.
4. වර්ධනය, තැලීම්, ක්ෂුද්‍ර ජීවීන් හා එතිලීන් නිෂ්පාදනය යි.
5. වර්ධනය, ශ්වසනය, එතිලීන් නිෂ්පාදනය හා උත්සේවේදනය යි.

35. එළවළුවල පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - එළවළු ගබඩා කිරීම, අඩු උෂ්ණත්ව හා වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාව යටතේ සිදු කරයි.

B - එළවළු අස්වනු නෙලීම උදෑසන කාලයේ සිදු කළ යුතුය.

එම ප්‍රකාශ දෙක සම්බන්ධ නිවැරදි වගන්තිය වනුයේ,

1. A හා B ප්‍රකාශ දෙකම නිවැරදි අතර, A මගින් B පැහැදිලි කරයි.
2. A හා B ප්‍රකාශ දෙකම නිවැරදි අතර, A මගින් B පැහැදිලි නොකරයි.
3. A නිවැරදි අතර, B වැරදි වේ.
4. A වැරදි අතර, B නිවැරදි වේ.
5. A හා B ප්‍රකාශ දෙකම නිවැරදි අතර, B මගින් A පැහැදිලි කරයි.

36. එළදෙනකගේ මද චක්‍රය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වනුයේ,

1. මදයට පැමිණි ගැහැණු සතුන්ගේ ප්‍රොජෙස්ටරෝන් සාන්ද්‍රණය ඉතා වැඩි ය.
2. ඩිම්බ නිදහස්වන මොහොතේ සතුන්ගේ LH මට්ටම වැඩි ය.
3. ඩිම්බ නිකුත් කරන අවස්ථාව වන විට සතුන්ගේ FSH මට්ටම ඉතා වැඩි ය.
4. ගැබ් ගන්නා අවස්ථාවල මද අතුර ඉතා කෙටි ය.
5. පසුමදය අවස්ථාව සිංචනය සඳහා වඩාත් සුදුසු ය.

37. වැඩුණු ගවයෙකුගේ ආහාර මාර්ග පද්ධතියට සාපේක්ෂව වසු පැටවෙකුගේ ආහාර මාර්ග පද්ධතියේ,

1. ජඨරාශය ඌන වර්ධනයක් පෙන්වන අතර විතංශිකාව විශාල වේ.
2. විතංශිකාව ඌන වර්ධනයක් පෙන්වන අතර ජඨරාශය විශාල වේ.
3. බහු නැමිය ඌන වර්ධනයක් පෙන්වන අතර ජඨරාශය විශාල වේ.
4. ග්‍රහනියේ ක්‍රියාකාරීත්වය සාපේක්ෂව වැඩි වේ.
5. රූමනයේ ක්‍රියාකාරීත්වය ඉතා අධික වේ.

38. ගව පැටවුන්ට මුල්කිරි ලබාදීමේ වැදගත්කම සම්බන්ධ සත්‍ය ප්‍රකාශය වනුයේ,

1. පොස්පොලිපිඩ අඩංගු නිසා ප්‍රතිශක්ති ගුණය වැඩි කරයි.
2. විරේක ගුණය නිසා උදරාබාධ ඇතිවීමේ අවධානම අඩු කරයි.
3. පොස්පොලිපිඩ අඩංගු වීමෙන් මේද ගෝලිකාවල ප්‍රමාණය කුඩා කරයි.
4. ඉමියුනොග්ලොබියුලින් මගින් ප්‍රතිශක්තිය වැඩි කරයි.
5. ලැක්ටෝස් අධික නිසා වර්ධන වේගය වැඩි කරයි.

39. කුකුළන් සඳහා කුඩු ආහාර වෙනුවට කැට ලෙස ආහාර සැපයීමෙන්,

1. සතුන්ට ආහාර ජීර්ණය සම්බන්ධ ගැටළු අවම කර ගත හැකි ය.
2. සතුන්ට පණු රෝග ඇති වීමේ අවධානම අවම කළ හැකි ය.
3. වැඩි ජල ප්‍රමාණයක් සැපයිය හැකි ය.
4. සතුන්ට ශ්වසන රෝග අවම කර ගත හැකි ය.
5. සතුන්ට වැඩි පෝෂක ප්‍රමාණයක් සැපයිය හැකි ය.

40. කුකුළන්ට ඇතිවන වෛරස් රෝග කාණ්ඩය වනුයේ,

1. කොක්සිඩියෝසිස්, පුල්ලෝරම් සහ රැනිකට් ය.
2. කොස්සිඩියෝසිස්, රැනිකට් සහ කුරුළු උණ ය.
3. රැනිකට්, ගම්බෝරෝ හා පුල්ලෝරම් ය.
4. කකුල් කොරවීම, රැනිකට් හා කුකුල් වසූරිය ය.
5. රැනිකට්, ගම්බෝරෝ හා කුරුළු උණ ය.

41. ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලන කලාප පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A - වැඩිම ගවයන් ප්‍රමාණයක් උඩරට කලාපයේ හමුවන අතර, වැඩිම බිම් ප්‍රමාණයක් වියළි කලාපයට අයත් වේ.

B - වැඩිම ගවයින් ප්‍රමාණයක් උඩරට කලාපයේ හමුවන අතර, වැඩිම කිරි නිෂ්පාදනයක් වියළි කලාපයෙන් ලැබේ.

C - වැඩිම බිම් ප්‍රමාණයක් වියළි කලාපයට අයත් අතර, ඒකක කිරි නිෂ්පාදනය වැඩි වනුයේ උඩරට කලාපයේ ය.

මෙයින් සත්‍ය ප්‍රකාශය වනුයේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. A හා B පමණි. 5. B හා C පමණි.


42. "තෙත් පෝෂ දළ ආහාර" ආහාර කාණ්ඩය සඳහා උදාහරණ වනුයේ,

1. ග්ලිරිසීඩියා, ඉදල් ඉරිගු හා ඉපිල් ඉපිල් ය.
2. සහල් නිවුඩු, ග්ලිරිසීඩියා හා සෝයා පුන්නක්කු ය.
3. සෙන්ට්‍රොසීමා, ගිණි හා බ්‍රැකේරියා බ්‍රිසැන්තා ය.
4. ගිණි, ඉපිල් ඉපිල් හා සෙන්ට්‍රොසීමා ය.
5. සහල් නිවුඩු, පොල් පුන්නක්කු හා ගිණි තෘණ ය.


43. පෝෂක ද්‍රාවණ තුළ  වගාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. නොගැඹුරු පෝෂණ ද්‍රාවණ පටල තාක්ෂණයේ දී ද්‍රාවණය වාතනයට විශේෂ උපකරණ අවශ්‍ය නොවේ.
2. කේෂික අවශෝෂණ වගාවේ දී ද්‍රාවණය වාතනයට විවිධ උපක්‍රම යොදා ගැනීමක් සිදු වේ.
3. මුල් ගිල්වූ වගාවක බඳුන සම්පූර්ණයෙන් ද්‍රාවණයෙන් පිරවීම අත්‍යවශ්‍ය වේ.
4. පාවෙන වගාවක ද්‍රාවණය වාතනය අත්‍යාවශ්‍ය නොවේ.
5. නොගැඹුරු පෝෂණ ද්‍රාවණ පටල තාක්ෂණයේ දී ද්‍රාවණය වාතයට විශේෂ ක්‍රමවේද යෙදීම අත්‍යවශ්‍ය වේ.


44. පහත දක්වා ඇති ප්‍රස්තාර අතුරින් කෘෂිකාර්මික භාණ්ඩ සඳහා මිල හා ඉල්ලුම අතර සම්බන්ධය වඩාත් හොඳින් විස්තර කරන ප්‍රස්තාරය වනුයේ,




1.




2.



3.



4.



5.

45. සැපයුම් වක්‍රය වමට විතැන්වීම සිදු වනුයේ,

1. නිෂ්පාදන සාධක මිල අඩු වීමය.
2. හිතකර දේශගුණික තත්ත්වයන් ය.
3. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා තාක්ෂණය පිරිහීම ය.
4. නිෂ්පාදකයන් මත සහන ලබා දීමය.
5. රජයේ ප්‍රතිපත්ති ලිහිල්වීම ය.

46. සමතුලිත වෙළෙඳපොළක ලක්ෂණයක් නොවන්නේ,

1. නිෂ්පාදනයක අතිරික්ත පැවතිය හැකි අතර, හිඟයක් නොමැති වීමය.
2. නිෂ්පාදනයට අතිරික්ත ඉල්ලුමක් නොමැති වීමය.
3. ඉල්ලුම සැපයුම සමාන වීමය.
4. නිෂ්පාදනයට අතිරික්ත සැපයුමක් නොමැති වීමය.
5. අතිරික්ත ඉල්ලුමක් හෝ සැපයුමක් නොමැති වීමය.

47. කාබනික ගොවිතැනට පදනම් වන මූලධර්ම කාණ්ඩය වනුයේ,

1. සැලකිලිමත් බව, ආර්ථික ප්‍රතිලාභ, සේවක ස්වස්ථාව හා සෞඛ්‍ය ය.
2. සාධාරණත්වය, සේවක ස්වස්ථාව, පරිසර විද්‍යා මූලධර්ම හා සෞඛ්‍ය ය.
3. ජෛව විවිධත්වය, සාධාරණත්වය, සැලකිලිමත් බව හා සෞඛ්‍ය ය.
4. සෞඛ්‍යය, පරිසර විද්‍යා මූලධර්ම, සැලකිලිමත් බව හා සාධාරණත්වය යි.
5. සෞඛ්‍ය, ජෛව විවිධත්වය, ආර්ථික ප්‍රතිලාභ හා සාධාරණත්වය යි.

48. ශෂ්‍ය බෝග මාරුව සිදු කරන වගා බිමක යොදා ගන්නා බෝග වර්ග හතරක් සංකේත මගින් දක්වා ඇත.

| | |
|---|---|
| B | C |
| A | D |

මෙහි BCD හා A බෝග කාණ්ඩ පිළිවෙළින්,

1. රනිල, ධාන්‍ය, අල බෝග හා එළවළු බෝග ය.
2. රනිල, අල, එළවළු හා ධාන්‍ය බෝග ය.
3. අල, ධාන්‍ය, එළවළු හා රනිල බෝග ය.
4. එළවළු, අල, රනිල හා ධාන්‍ය බෝග ය.
5. අල, එළවළු, රනිල හා ධාන්‍ය බෝග ය.

49. ක්ෂයරෝගය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - මී ගවයින් මෙම රෝගයට ධාරකයන් ලෙස ක්‍රියා කරයි.

B - *Leptospira interrogans* බැක්ටීරියාව මගින් ඇති වේ.

C - පැස්ටරීකරණය නොකළ කිරි මගින් ඇති විය හැක.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වගන්තිය වනුයේ,

1. A හා C පමණි.
2. A හා B පමණි.
3. A පමණි.
4. B පමණි.
5. C පමණි.

50. පරාග කාරක හිඟ වීමට බලපාන සාධක වනුයේ,

1. පරිසරය දූෂණය, නාගරීකරණය, ඒකබෝග වගාව හා ස්වභාවික වාසස්ථාන හිඟවීම ය.
2. වායු දූෂණය, ලවණීකරණය, නාගරීකරණය හා ඒක බෝග වගාව යි.
3. පරිසර දූෂණය, නාගරීකරණය, කෘමිනාශක භාවිතය හා කෘමි සතුන්ට ආහාර හිඟවීම යි.
4. එල්නිනෝ තත්ත්ව, ඒකබෝග වගාව, ලවණීකරණය හා පළිබෝධ නාශක භාවිතය යි.
5. රසායනික පොහොර, කාබනික අපද්‍රව්‍ය, නාගරීකරණය හා ඒක බෝග වගාවයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ. පො. ස. (උ. පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2020

13 ශ්‍රේණිය | කෘෂි විද්‍යාව II | 08 S II | පැය තුනයි / மூன்று மணித்தியாலம் / Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :
* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.

## A කොටස - ව්‍යුහගත රචනා

01. A) විවිධ කරුණු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාව කෘෂි දේශගුණික කලාප ගණනාවකට බෙදා ඇත.

i. ශ්‍රී ලංකාව කෘෂි දේශගුණික කලාපවලට බෙදීමේ දී පදනම් කරගත් සාධක **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

ii. ශ්‍රී ලංකාව තුළ කෘෂි දේශගුණික කලාප කීයක් හඳුනාගත හැකි ද?

..........................................................................................

iii. ඒවායින් වියළි දේශගුණයක් පවතින කලාපය නම් කරන්න.

..........................................................................................

iv. සුළං දිශා දර්ශකය ආධාරයෙන් සුළගේ දිශාව නිර්ණය කරන්නේ කෙසේද ?

..........................................................................................

..........................................................................................

B) යම් ප්‍රදේශයකට වර්ෂාපතනය ලැබීමට ජල චක්‍රය සෘජුවම බලපායි.

i. ජල චක්‍රය යනු කුමක්ද ?

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

ii. ජල චක්‍රයේ සංරචක අතුරින් වායුගෝලයේ සිදුවන සංරචක දෙක නම් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

iii. කාලගුණික පද්ධති ප්‍රධාන ආකාර තුන නම් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

3. ..........................................................................................

C) 1978 ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික ක්‍රමය නව මගකට යොමු කරමින් නව ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දෙන ලදී.

i. විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

ii. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට රජය ගෙන ඇති පියවර **තුනක්** ලැයිස්තුගත කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

iii. ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................................

..........................................................................................................................

2. ..........................................................................................................................

..........................................................................................................................

D) පාංශු වර්ණය, උෂ්ණත්වය, වයනය ආදී භෞතික ලක්ෂණ කෘෂිකර්මික කටයුතුවල දී විවිධ ආකාරයට මැනීම් සිදු කරයි.

i. මන්සල් වර්ණ සටහනේ පහත දර්ශක මගින් මනිනු ලබන පරාමිතීන් සඳහන් කරන්න.

1. chroma - ..........................................................................................................

2. hue - ..........................................................................................................

3. value - ..........................................................................................................


ii. පහත සාධක මැනීමට යොදා ගන්නා ඒකක නම් කරන්න.

1. දෘශ්‍ය ඝනත්වය - ....................................................................................

2. තෙතමන ප්‍රමාණය - ....................................................................................

3. සච්ඡිද්‍රතාවය - ....................................................................................

E) පසේ ජලය ආකාර ගණනාවකට පවතින අතර, පහත රූප සටහනේ ආකාර කිහිපයක් දක්වා ඇත.



i. මෙහි A, B හා C ලෙස දක්වා ඇති ජල වර්ග හඳුනා ගන්න.

A - ..............................................................................................................................

B - ..............................................................................................................................

C - ..............................................................................................................................

ii. පසට ජලය ලැබෙන ආකාර **දෙකක්** නම් කරන්න.

1. ..............................................................................................................................


2. ..............................................................................................................................

iii. ප්‍රශස්ථ බෝග වර්ධනයකට අදාළ තෙතමනයක් සහිත පසක පවතින ජල වර්ග මොනවාද ?

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

F) ශ්‍රී ලංකාවේ විවිධ දුෂ්පෝෂණ තත්ත්වයන් දැකිය හැකි අතර, පහත දක්වා ඇත්තේ මන්ද පෝෂණ චක්‍රයයි.




i. මෙහි A හා B අවස්ථාවන් නම් කරන්න.

A - ..............................................................................................................................

B - ..............................................................................................................................

ii. ආහාරයක් නරක්වීමට බලපාන ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියා කෙරෙහි බලපාන ආහාරයේ අභ්‍යන්තර සාධක **දෙකක්** සඳහන් කරන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

02. A) ක්ෂීරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය කෙරෙහි පහත හෝමෝනවල බලපෑම සඳහන් කරන්න.

i. තයිරොක්සින් - ......................................................................

ii. ඔක්සිටොසින් - ......................................................................

iii. ඊස්ට්‍රජන් - ......................................................................

iv. ප්‍රොලැක්ටින් - ......................................................................

B) රක්කවීමට බිත්තර තෝරා ගැනීමේ දී ගුණාත්මක බිත්තර තෝරා ගැනීමෙන් විවිධ වාසි අත් වේ.

i. රක්කවීමට සුදුසු බිත්තරවල සලකනු ලබන බාහිර ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

1. ......................................................................

2. ......................................................................

ii. රක්කවීමට බිත්තර තේරීමේ දී ඉවත් කරනු ලබන බිත්තර වල පැවතිය හැකි ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

1. ......................................................................

2. ......................................................................

3. ......................................................................

iii. බිජෞෂකයක් තුළ බිත්තර තැන්පත් කළ යුතු දිශානතිය සඳහන් කරන්න.

......................................................................

C) දෙමුහුම් අභිජනනයේදී "දෙමුහුම් දිරිය" නම් සංසිද්ධිය ප්‍රයෝජනවත් වේ.

i. "දෙමුහුම් දිරිය" පළමු දෙමුහුම් පරම්පරාවේ පමණක් පැවතීමට හේතුව කුමක් ද?

......................................................................


......................................................................

ii. සතුන් වරණය කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගත හැකි මාර්ග **දෙකක්** සඳහන් කරන්න.

1. ......................................................................

2. ......................................................................

D) යොදන පොහොර ප්‍රමාණය හා පොහොර භාවිත කාර්යක්ෂමතාවය අතර සම්බන්ධතාවය පහත ප්‍රස්තාරයෙන් දක්වා ඇත.



i. පොහොර භාවිත කාර්යක්ෂමතාවය යනු කුමක්ද ?

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

ii. මෙහි I හා J ලක්ෂ්‍ය අතර වෙනස කුමක්ද ?

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

iii. CC සීමාව දක්වා බෝග සඳහා පෝෂක ප්‍රභවය කුමක් විය හැකි ද?

..........................................................................................................................................................................

iv. A සහ B ලක්ෂ්‍යයන් හඳුනා ගන්න.

A - ..........................................................................................................................................

B - ..........................................................................................................................................

E) බෝග සංස්ථාපනය සඳහා වර්තමානයේ විවිධ යන්ත්‍ර වර්ග යොදාගැනීම ජනප්‍රිය වෙමින් පවතී.

i. පහත වර්ගීකරණයට අදාළ යන්ත්‍රය බැගින් නම් කරන්න.

1. ගොඩ බෝග සඳහා යොදා ගන්නා උපකරණයක්.

..................................................................................................................................................................

2. පැළ සිටුවීමට යොදා ගන්නා උපකරණයක්

..................................................................................................................................................................

ii. බීජ සැකසීමෙන් සිදුවන රසායනික හා ජෛවීය වෙනස්කම බැගින් සඳහන් කරන්න.

රසායනික - ..........................................................................................................................

ජෛවීය - ..........................................................................................................................

F) බෝග ක්ෂේත්‍රයකට ජලය සම්පාදනය කිරීමේදී නිර්දේශිත ප්‍රමාණයන් ලබාදීමෙන් නාස්තිය අවම වන අතර, අස්වැන්න ද උපරිම වේ.

i. ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාවය යනු කුමක්ද ?

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

ii. යම් ක්ෂේත්‍රයකට ලීටර් 500 සපයන ලද අතර, එම ක්ෂේත්‍රයේ බෝග ශාක මගින් අවශෝෂණය කළ ප්‍රමාණය ලීටර 430 නම්, ජල සම්පාදන කාර්යක්ෂමතාවය කොපමණද ?

..........................................................................................................................................................................

iii. එම ක්ෂේත්‍රයේ ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාවය මි. මි. 25 නම් දළ ජල සම්පාදන අවශ්‍යතාවය ගණනය කරන්න.

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

iv. බිංදු ජල සම්පාදනයට සාපේක්ෂව විසිරි ජල සම්පාදනයේ වාසියක් හා අවාසිය බැගින් සඳහන් කරන්න.

වාසි - ..............................................................................................

අවාසි - ..............................................................................................

G) ශාක වර්ධනය මැනීම සඳහා විවිධ වර්ධන පරාමිතීන් යොදා ගනී.

i. ශාක වර්ධනය අර්ථ දක්වන්න.


..............................................................................................


..............................................................................................


ii. සාමාන්‍ය බෝග ශාකයක ශාක වර්ධන වක්‍රයක් අක්ෂ ලකුණු කර ඇඳ පෙන්වන්න.



03. A) ශාක ප්‍රචාරණයේ දී යොදා ගන්නා උපකරණ කිහිපයක් පහත දැක්වේ.


A


B


C


D

i. එක් එක් උපකරණයේ ශාක ප්‍රචාරණයට අදාළ ප්‍රධාන කාර්යය නම් කරන්න.

A - ..............................................................................................

B - ..............................................................................................

C - ..............................................................................................

D - ..............................................................................................

ii. බද්ධ අසංගතිය වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

..............................................................................................

..............................................................................................

iii. පහත දඬු කැබලි වර්ග සංස්ථාපනයට සුදුසු අවස්ථාවන් සඳහන් කරන්න.

ඉන්නල - ..............................................................................................

මුරුංගා - ..............................................................................................

iv. බිත්තර වී සඳහා පැවතිය යුතු බීජවල තිබිය යුතු පහත සාධකවල සීමාවන් සඳහන් කරන්න.

තෙතමනය - ..............................................................................................

වෙනත් අපද්‍රව්‍ය - ..............................................................................................

B) බෝග වගා කිරීමේ දී ගොවීන්ට ශාකවල රෝග පළිබෝධ හානින්ගේ ලක්ෂණ මත ඒවා හඳුනා ගැනීම ඉතා වැදගත් වේ.

i. ක්ෂේත්‍රයේ දී විද යුෂ උරාබොන කෘමියෙකුගේ හානි හඳුනා ගැනීමේ දී භාවිතා කළ හැකි ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

ii. මයිටාවන් හා දර්ශීය කෘමීන්ගේ මෞඛ උපාංගවල දැකිය හැකි වෙනස්කමක් සඳහන් කරන්න.

..............................................................................................................................................

iii. පළිබෝධ නාශක යෙදීමේ දී අනුගමනය කළ යුතු ආරක්ෂිත පිළිවෙත් **තුනක්** සඳහන් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

C) ආහාර පරිරක්ෂණ මූලධර්ම හා ක්‍රමයන් පදනම් කරමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පරිරක්ෂණ ක්‍රමය | මූලධර්මය | නිදසුන් |
|---|---|---|
| pH අගය අඩු කිරීම | ......................................... | පැසවීම |
| .............................. | නිශේධනය | .............................. |
| තාප ප්‍රතිකාර | .............................. | පැස්ටරීකරණය |
| ප්‍රවිකිරණය | අක්‍රීය කිරීම / විනාශ කිරීම | විවිධ ආහාර වර්ග |

D) කෘෂි රසායනිකයන්ගේ විෂවල බලපෑම අනුව ආකාර කිහිපයක් වන අතර, ඒවා ක්‍රියාත්මක වනුයේ විවිධ ආකාරයටය.

පහත විෂතාවයන්ගේ බලපෑම කෙටියෙන් හඳුන්වන්න.

a) ප්‍රාදේශික විෂ බව

..............................................................................................................................................

b) උග්‍ර විෂ බව

..............................................................................................................................................

C) සංස්ථානික විෂ බව

..............................................................................................................................................

D) නිදන්ගත විෂ බව

..............................................................................................................................................

..............................................................................................................................................

E) පහත පද කෙටියෙන් විස්තර කරන්න.

i. බහු ගුණක

.................................................................................................................................................

.................................................................................................................................................

ii. දෙමුහුම් දිරිය

.................................................................................................................................................

.................................................................................................................................................

iii. විකෘති අභිජනනය

.................................................................................................................................................

.................................................................................................................................................

F) පාලිත තත්ත්ව යටතේ සාමාන්‍යයෙන් වගා කරනුයේ ආර්ථික වටිනාකම වැඩි ආහාර බෝග වර්ග යි.

i. ආරක්ෂිත ව්‍යුහ තුළ බෝග වගාවේ දී ඇතිවිය හැකි ගැටළු **දෙකක්** සඳහන් කරන්න.

1. .............................................................................................................................................
2. .............................................................................................................................................

ii. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේ දී පාලනය කරන සාධක **තුනක්** නම් කරන්න.

1. .............................................................................................................................................
2. .............................................................................................................................................
3. .............................................................................................................................................

iii. ශ්‍රී ලංකාවේ පොලිතීන් උමං භාවිතයෙන් පාලනය කරනු ලබන ප්‍රධානම පරිසර සාධකය කුමක්ද ?

.................................................................................................................................................

iv. ශ්‍රී ලංකාවේ පොලිතීන් උමං භාවිතයේ ප්‍රධානම ගැටළුව කුමක්ද ?

.................................................................................................................................................

G) නිර්පාංශු වගාවක් නිසි ලෙස කළමනාකරණය කිරීමෙන් ඉහළ ගුණත්වයෙන් යුතු අස්වැන්නක් ලබාගත හැකි ය.

i. සිරස් වගා මළු සඳහා වඩාත් යෝග්‍ය මාධ්‍යයක් නම් කරන්න.

.................................................................................................................................................

ii. එම මාධ්‍ය තෝරා ගැනීමට ප්‍රධානම හේතුව කුමක්ද ?

.................................................................................................................................................

iii. ජල රෝපිත වගාවකට ප්‍රසස්ථ pH පරාසය කුමක්ද ?

.................................................................................................................................................

iv. ශ්‍රී ලංකාවේ නිර්පාංශු වගාවන් සිදු කිරීමේ දී පවතින ගැටළු **දෙකක්** සඳහන් කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

04. A) ශ්‍රී ලංකාවේ අතීතයේ සිට වර්ෂාරෝපිත වගාව සිදු කරන ලදී.

i. වර්ෂාරෝපිත වගාව අර්ථ දක්වන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

ii. මෙම වගා ක්‍රමය යටතේ යල කන්නයේ වගා කරනු ලබන ප්‍රධාන බෝගය කුමක්ද ?


..............................................................................................................................................

iii. මෙම වගා ක්‍රමයේ වාසියක් හා අවාසියක් සඳහන් කරන්න.

වාසි - ..............................................................................................................

අවාසි - ..............................................................................................................

B) නිෂ්පාදන ශ්‍රිතයක විවිධ කලාප පහත ප්‍රස්තාරයෙන් පෙන්වා ඇත.




i. ප්‍රස්ථාරයේ A, B හා C ලෙස දක්වා ඇත්තේ මොනවාද ?

A - ..............................................................................................

B - ..............................................................................................

C - ..............................................................................................

ii. මෙම ප්‍රස්තාරයේ හීනවන ඵල ලැබීම ආරම්භවන අවධිය සඳහන් කරන්න.

..............................................................................................................................................

iii. යම් නිෂ්පාදකයෙක් ප්‍රශස්ථ ම නිෂ්පාදනය පෙන්වනුයේ කුමන අවධියේ ද?

..............................................................................................................................................

iv. සම නිෂ්පාදන වක්‍රයක් යනු කුමක්ද ?

..............................................................................................................................................

..............................................................................................................................................

C) පහත දැක්වෙන ප්‍රකාශවල සත්‍ය අසත්‍යතාව සඳහන් කරන්න.

i. ආයතනයක නිෂ්පාදන රහස් සොරකම් නොකිරීම අභ්‍යන්තර ආචාර ධර්මයකි. - ..................................

ii. ව්‍යාපාර සැලැස්මක ව්‍යාපාර විස්තරය යනු එහි දැක්මයි. - ..................................

iii. අගය දාම විශ්ලේෂණය නිසා ආයතනයක නිෂ්පාදන ධාරිතාව වැඩි වේ. - ..................................

iv. කෘෂි ව්‍යාපාරයක් සංවිධානය කිරීමේ මූලික පියවර තුනකි. - ..................................

D) ශාක අතු බැඳීමේ දී මවු ශාකයට සම්බන්ධව තිබියදී ම නව ශාකයක් බවට වර්ධනය කර ගනී.

i. අතු බැඳීමේ දී කැපුම අසලින් මුල් ඇදීම සිදුවීමට අවශ්‍ය මූලික තත්ත්ව **දෙක** කුමක් ද?

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

ii. සංයුක්ත අතු බැඳීම සිදු කිරීමට යෝග්‍ය ශාක **දෙකක්** නම් කරන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

iii. අතු බැඳීම නිසා ශාකයක ඇති විය හැකි ගැටළු **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

iv. ශාක අතු බැඳීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

E) i. දේශගුණික විපර්යාස ඇතිවීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

ii. ජාන විකරණය කරන ලද ආහාර භාවිතයේ අහිතකර බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

iii. යථා තත්‍ය කෘෂිකර්මය (Precision Agriculture) යනු කුමක්ද ?

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

F) වර්තමානයේ අස්වනුවල පරිණත බව පරීක්ෂාවට නවීන ක්‍රමවේදයන් යොදා ගනී.

i. පහත බෝග අස්වනු සඳහා පරිණත බව හඳුනා ගැනීමට යොදාගත හැකි උපක්‍රමය බැගින් සඳහන් කරන්න.

| අස්වනු වර්ගය | පරිණත දර්ශකය |
|---|---|
| 1. කෙසෙල් | .................................................................................................. |
| 2. අඹ | .................................................................................................. |

ii. අන්ත උපරිම පලතුරු ඉදීමේ ක්‍රියාවලියේ දී කාලය සමග ශ්වසන වේගය හැසිරෙන ආකාරය පහත ප්‍රස්තාරයේ ඇඳ පෙන්වන්න.



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ. පො. ස. (උ. පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2020

13 ශ්‍රේණිය | කෘෂි විද්‍යාව II | 08 S I

උපදෙස් : * ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
* අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූපසටහන් අඳින්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි.)

## B කොටස - රචනා

05. i. වර්ෂාපතනය බෝග නිෂ්පාදන කටයුතුවලට බලපාන ආකාරය විස්තර කරන්න.
ii. කෘෂිකාර්මික කටයුතුවලදී වර්ධක යාමක ඵලදායිව භාවිත කළ හැකි ආකාරය විස්තර කරන්න.
iii. ආහාර ඇසුරුම්කරණයේ වැදගත්කම විස්තර කරන්න.

06. i. බීජ සෞඛ්‍යයෙහි වැදගත්කම විස්තර කරන්න.
ii. අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සශ්‍රීකත්වයට දේශීය තාක්ෂණය ඉවහල් වූ ආකාරය විස්තර කරන්න.
iii. කෘත්‍රිම සිංචන ක්‍රියාවලියේ පියවර විස්තර කරන්න.

07. i. පාංශු සෞඛ්‍ය රැකෙන පරිදි කෘෂි රසායන කළමනාකරණය කළ යුතු ආකාරය විස්තර කරන්න.
ii. තිරසර කෘෂිකර්මාන්තයට වැදගත්වන පාරිසරික මූලධර්ම විස්තර කරන්න.
iii. කිකිළි බිත්තරයක ව්‍යුහය රූප සටහනක් ඇසුරින් විස්තර කරන්න.

08. i. ඒකාකාරී තරග වෙළෙඳපොළහි හා පූර්ණ තරගකාරී වෙළෙඳපොළ අතර වෙනස්කම් විස්තර කරන්න.
ii. බලවේග වර්ගයේ දියර ඉසින උපකරණයක ක්‍රියාකාරීත්වය විස්තර කරන්න.
iii. කොම්පෝස්ට් පොහොර සෑදීමේ දී විවිධ අවධීන් තුළ සිදුවන විද්‍යාත්මක ක්‍රියාවලිය විස්තර කරන්න.

09. i. අවම බිම් සැකසීමේ වාසි හා අවාසි විස්තර කරන්න.
ii. නිර්පාංශු වගාවක් සඳහා වගා මාධ්‍යයක් තේරීමේ දී සැලකිය යුතු කරුණු විස්තර කරන්න.
iii. විදුලි බලයෙන් ක්‍රියාකරන කේන්ද්‍රාපසාරී පොම්පයක් සවිකරන ආකාරය විස්තර කරන්න.

10. i. කෘෂි කර්මාන්තය සම්බන්ධ සෞඛ්‍ය ගැටළු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.
ii. දේශගුණික විපර්යාස මගින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සිදුවිය හැකි බලපෑම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.
iii. පලතුරු පසු අස්වනු හානි අවම කිරීමට පසු අස්වනු තාක්ෂණය යොදා ගත හැකි අවස්ථා විස්තර කරන්න.